# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.09.12 පැය 1515 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1749/25 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මහරගම පුවක්පිටිය විපස්සාරාම විහාරස්ථානයේ පැවැත්වෙන ඇසළ මහා පෙරහර හේතුවෙන් රථවාහන ගමනාගමනය සීමා කිරීම – මහරගම පොලිස් වසම**

මහරගම පොලිස් වසමේ පුවක්පිටිය විපස්සාරාම විහාරස්ථානයේ පැවැත්වෙන වාර්ෂික ඇසළ මහා පෙරහර 2025.09.13 වන දින පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

ඒ අනුව, මෙම පෙරහර 2025.09.13 වන දින සවස 0730 සිට අළුයම 03.00 දක්වා විපස්සාරාම විහාරස්ථානයෙන් ආරම්භ වී විපස්සාරාම පාර දෙහිවල පාර ඔස්සේ මහරගම ඩිපෝව අසල විද්‍යාකර මාවතෙන් දකුණට විද්‍යාකර මාවත ඔස්සේ ගමන් කර හයිලේවල් පාර ඇල්හේන පාරෙන් වමට ගමන් කර මහරගම ඔරලෝසු කණුව අසලින් නැවත දෙහිවල පාර ඔස්සේ විහාරස්ථානය වෙත ගමන් කිරීමට නියමිතව ඇත.

එබැවින් පෙරහර ගමන් ගන්නා කාලය තුල එම මාර්ග භාවිතා කරන රියදුරන් හා මහජනතාව වෙත පහත විකල්ප මාර්ග භාවිතා කරන මෙන් ඉල්ලා සිටියි.

**භාවිතා කල හැකි විකල්ප මාර්ග**

- හයිලෙවල් මාර්ගයේ කොළඹ දිසාවට ගමන් ගන්නා රථ වාහන ජනාධිපති හන්දියෙන් පරණ පාර ඔස්සේ ද දෙහිවල, පිළියන්දල, බොරලැස්ගමුව ගමන් ගන්නා රථවාහන ජනාධිපති හන්දියෙන් වම් පසට ඇති මාර්ගය ඔස්සේ ගමන් කල හැක.
- හයිලෙවල් මාර්ගයේ කොට්ටාව දෙසට ධාවනය වන රථ වාහන පරණ පාර ඔස්සේ බොරලැස්ගමුව, දෙහිවල පිලියන්දල ගමන් ගන්නා වාහන වත්තේගෙදර හනදියෙන් වත්තේගෙදර මාර්ගය ඔස්සේ ගමන් කල හැක.
- බොරලැස්ගමුව දෙස සිට මහරගම කොට්ටාව හයිලෙවල් මාර්ගය ඔස්සේ ගමන් ගන්නා වාහන වැව පාර ඔස්සේ වත්තේගෙදර හරහා ගමන් කල හැක.
- පිළියන්දල දෙස සිට මහරගම කොට්ටාව කොළඹ දිසාවට ගමන් ගන්නා වාහන සොම්රෝ හෝටලට අසලින් දකුණට ඇති මාර්ගය ඔස්සේ ගමන් කල හැක.

ඉහත නිවේදනය මහජනතාවගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය ආයතනය මගින් ප්‍රචාරයක් ලබා දීමට අවශ්‍ය කටයුතු කර දෙන කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**